ප්‍රංසයේ ජීවත් වන ශ්‍රී ලාංකිකයින් දෙදෙනෙකු ඝාතනය කළ බවටත්, ඊට තවත් ශ්‍රී ලාංකිකයින් දෙදෙනෙකු සැකකරුවන් වන බවත් ශ්‍රී ලංකාවේ මාධ්‍ය තුළද සඳහන්ව තිබිණි. එහිදී ජනවාරි 18 සිට 24 දක්වා තෝරාගත් මාධ්‍ය තුළ එම සැකකරුවන්ගේ වාර්ගිකත්වය දැක්වී තිබූ ආකාරය පහත පරිදි වේ.

ඒ සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණයන් සහ පැනයන් මෙසේ ඉදිරිපත් කරමු.

1) මෙම සිදුවීමේ වින්දිතයින් සහ සැකකරුවන් වෙනත් රටක සිටින ශ්‍රී ලාංකිකයින් වේ. ඒ අනුව ඔවුන්ගේ ජාතිකත්වය (ශ්‍රී ලාංකිකයන් බව) සඳහන් කිරීම සිදුවීමට අදාළ වේ.

2) දිවයින ඉරිදා සංග්‍රහයේ (01/24) මෙම සැකකරුවන්ගේ වාර්ගිකත්වය සඳහන් කර තිබූ අතරම, ඊට අමතරව ඔවුන්ගේ නම්ද සඳහන් කර තිබිණි. මෙසේ සැකකරුවන්ගේ නම් හෙළිදරව් කරන අතරම වාර්ගිකත්වයද හෙළි කිරීම පුවතට අදාළද?

3) මෙම සිදුවීම කිසියම් ආකාරයකට ඔවුන්ගේ වාර්ගිකත්වය අදාළ වන කෝණයකින් නිරීක්ෂණය කළ හැකි වන්නේද? වෙනත් ලෙසකින් දක්වන්නේ නම්, මෙම සිදුවීමට වින්දිතයින්ගේ හෝ සැකකරුවන්ගේ හෝ වාර්ගිකත්වය අදාළ වේ යැයි ඔබ සිතන්නේද?

4) ඒ අනුව මෙම දක්වා ඇති පුවත් වාර්තාවන් තුළ අදාළ සැකකරුවන්ගේ වාර්ගිකත්වය දක්වා තිබීම සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

#MediaEthicsSL #lka #EnglishPress #SinhalaPress #CeylonToday #Mawbima #Divaina #SundayDivina #Dinamina